# <u>දැන්වීමයි.</u>

## <u>2026 වර්ෂය සඳහා උතුරු මැද පළාත් සභාවේ සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.</u>
## <u>නැවත සමීක්ෂණය.</u>

2026 වර්ෂයට උතුරු මැද පළාත් සභාවේ සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා 2025.07.14 දින පලකරන ලද පුවත්පත් දැන්වීමට අදාලව සැකසූ 2026 වර්ෂයේ උතුරු මැද පළාත් සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණය මේ වන විට උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වෙබ් අඩවිය වන www.cs.nc.gov.lk හි මේ වන විට පළකර ඇත.

ඔබ; 2026 වර්ෂයට උතුරු මැද පළාත් සභාවේ සැපයුම්කරුවකු ලෙස හෝ කොන්ත්‍රාත්කරුවකු ලෙස හෝ ලියාපදිංචි වීමට අපේක්ෂිතව අයදුම්පත් ඉදිරිපත් කලද ලියාපදිංචි සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයේ තම විස්තර නොමැති අයෙකු නම් **<u>2026.04.10 දිනට පෙර</u>** පහත සඳහන් තොරතුරු උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශය වෙත අතින් ගෙනැවිත් භාරදීමට හෝ **“ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, පළාත් සභා සංකීර්ණය, උතුරු මැද පළාත, අනුරාධපුර“** යන ලිපිනයට ලේඛණගත තැපෑලෙන් යොමු කිරීමට හෝ කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**<u>ඉදිරිපත් කල යුතු ලේඛණ -</u>**

- ❖ නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත
- ❖ මුදල් ගෙවූ ලදුපතෙහි පැහැදිළි ඡායා පිටපත
- ❖ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකයේ හෝ සමාගම් ලියාපදිංචි සහතිකයේ හෝ පැහැදිළි ඡායා පිටපත
- ❖ කොන්ත්‍රාත්කරුවකු ලෙස ලියාපදිංචි වීමට අයදුම් කරන්නේ නම් ICTAD ලියාපදිංචි සහතිකයේ පැහැදිලි ඡායා පිටපතක්

මෙය අවසාන වශයෙන් සිදුකරනු ලබන නැවත සමීක්ෂණය වන බැවින් 2026.04.10 දිනෙන් පසුව කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කිසිදු අවස්ථාවක් නොමැති බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

ප්‍රධාන ලේකම්,<br>
ප්‍රධාන ලේකම් කාර්යාලය,<br>
උතුරු මැද පළාත.